**බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම**
**2012 ඔක්තෝබර් මස 23 වන දින පෙ.ව 9.30ට**

# න්‍යාය පත්‍රය

**I. සභාපතිවරයාගේ නිවේදන**

**II. ලිපි ලේඛන පිළිගැන්වීම**

**III. කාරක සභා වාර්තා පිළිගැන්වීම**

**IV. පෙත්සම්**

**V. ප්‍රශ්න**

**01. ගරු ඒ.එම් යූසුෆ් මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට :**
**(ප්‍ර/V**
**(01)12/21)**

අ. පයාගල ස්කාගාර සමූපකාර සමිතිය වර්තමානයේ පාලනය වන්නේ සමූපකාර කොමසාරිස්තුමා පත්කරන ලද අධ්‍යක්ෂක මණ්ඩලයෙන්ද, එසේත් නැත්නම් සමූපකාර සාමාජිකයින්ගෙන් පත්කළ අධ්‍යක්ෂක මණ්ඩලයකින්ද?

ආ. එහි සභාපතිවරයා කවුරුන්ද?

ඇ. මෙම සමූපකාර සමිතියට "රා" සපයනු ලබන සැපයුම්කරුවන් කවුරුන්ද ?

ඈ. එම සැපයුම්කරුවන් ගණන කීයද ?

ඉ. ඔවුන්ගේ නම් සහ ලිපිනයන් සභාවට ඉදිරිපත් කරන්නේද?

ඊ. මසකට "රා" ලීටර කොපමණ ප්‍රමාණයන් සමිතියට ලැබෙන්නේද?

උ. "රා" ලීටරයකට ගෙවනු ලබන මුදල කොපමණද ?

ඌ. ලැබෙන "රා" වලින් ස්ප්‍රීතු හෝ අරක්කු කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය වන්නේද ?

**02. ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට :**

**(ප්‍ර/V (01)12/22)**

අ. "මිනිස්ට්‍රි ඔෆ් ක්‍රැබ්" නමින් කොළඹ නගරයේ ව්‍යාපාරයක් (රෙස්ටුරන්ට්) ලියාපදිංචි කර ඇති බව ඔබතුමා දන්නෙහිද?

ආ. එකී ව්‍යාපාරය සඳහා බස්නාහිර පළාතේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචිය ලබා දී තිබේද ?

ඇ. "මිනිස්ට්‍රි ඔෆ් " යන වචනය ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමට යොදා ගැනීමට නොහැකි බව ඔබතුමා දන්නෙහිද?

ඈ. ලියාපදිංචි කර නොමැති නම් එකී ව්‍යාපාරයේ නාමය යටතේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක්ද ?

**03. ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට :**

**(ප්‍ර/V (01)12/23)**

අ. 2010 වසරේ බස්නාහිර පළාතේ ව්‍යාපාර පිරිවැටුම් බදු (**B.T.T**) ආදායම කොපමණද ?

ආ. 2011 වසරේදී අවලංගු කරන ලද **B.T.T** බදු ආදායම වෙනුවට මෙම පළාත් සභාවට ලැබෙන ජාතිය ගොඩනැඟීමේ බද්ද **N.B.T** තුලින් පසුගිය සැප්තැම්බර් 31 දක්වා ලැබුණු ආදායම කීයද ?

ඇ. 2011 වසර සඳහා ජාතිය ගොඩනැඟීමේ බද්දෙන් අපේක්ෂිත ආදායම ලෙස අයවැයේදී පෙන්වා දී ඇති මුදල කීයද?

ඈ. ඉතිරි මුදල අයකර ගැනීමට ගන්නා පියවර කුමක්ද ?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ රැස්වීම්

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

**යෝජනාව :**

" 2013 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් සම්බන්ධයෙන් මීන් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා, 2012.10.10 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළඹුණු එකඟතාවයද සැලකිල්ලට ගෙන 2012 දෙසැම්බර් මස 05,06,07 හා 10 යන දිනයන් " ***2013 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන්*** " විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය"

## X. සභාවේ කටයුතු

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

"*අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය*"

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය :**

"බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුල පවතින පොදු ඇල වේලි, කාණු පද්ධති, වීථි (පාරවල්) සහ ඒ සඳහා වෙන්කර ඇති සීමාවන් දක්වමින් නියමාකාරයෙන් පිඹුරුපත් සකස් කර ගැසට් කිරීම ක්‍රමානුකූලව මෙතෙක් සිදුවී නොමැති හෙයින් අනවසර ගොඩකිරීම් සහ අනවසර ඉදිකිරීම් වලක්වා ගැනීමට මෙන්ම, ගංවතුර තර්ජන, ඩෙංගු උවදුර වැනි පොදු ආපදා අවස්ථාවන්හිදී පවා

පළාත් පාලන ආයතන වලට නියමානුකූලව ක්‍රියාත්මක වීමටද නොහැකි තත්වයන් උද්ගතව ඇත. එසේ හෙයින් මෙම පළාත් සභා බල ප්‍රදේශය තුල පවතින සියළු පොදු ඇල වේලි, කානු පද්ධති, වීථි (පාරවල්) සහ ඒ සඳහා වෙන්කර ඇති සීමාවන් පළාත් පාලන ආයතන මඟින් නියමාකාරයෙන් හඳුනා ගෙන නිසි පිඹුරුපත් සකස් කර ඒවා ගැසට් කිරීමෙන් ඉදිරියේදී පළාත් පාලන ආයතනයන් මුහුණ දිය හැකි නීතිමය ගැටළු අවම කර ගැනීමටත්, අනවසර ඉදිකිරීම්, ගොඩකිරීම්, පදිංචිවීම්, අවම කර ගැනීමෙන් පොදු ජනතාවට පුළුල් සේවාවක් සැපයීමටත් ක්‍රියා කළ යුතු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටී. ”

**(යෝ/v(01)12/12)**

**02. ගරු සලෝචන ගමගේ මන්ත්‍රීතුමා :**

“ බස්නාහිර පළාත තුල, කඩ සාප්පු, හෝටල් හා වෙළඳ සැල්වල ලක්ෂ සංඛ්‍යාත පිරිසක් සේවයේ යෙදෙන අතර, එම සේවක සේවිකාවන්ට නිසි වැටුපක්, අර්ථ සාධක අරමුදල්, පාරිතෝෂික, නිවාඩු අතිකාල දීමනා විධිමත් ආකාරයෙන් නොලැබෙන බැවින්, එම සේවකයන්ගේ සේවක අයිතිවාසිකම් ආරක්ෂා කර දීම, අවම වැටුපක් නිර්ණය කිරීම ඇතුළු ඔවුන් මුහුණ දෙන එම ගැටළු හඳුනා ගෙන එම ගැටළු විසඳීම සඳහා නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත්කළ යුතු බවටත්, එම නිර්දේශ අනුව විසඳුම් ලබා දීමට ක්‍රියා කළ යුතු බවටත් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයේ කම්කරු අමාත්‍යාංශය වෙත යොජනා කරයි. ”

**(යෝ/v(01)12/13)**

## XII. පොදු කටයුතු

**01. ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප)**

**2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පීඩා වැලැක්වීමේ**
**<u>ප්‍රඥප්තිය යටතේ සම්පාදනය කරන ලද රීති</u>**

2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පීඩා වැලැක්වීමේ ප්‍රඥප්තියේ 21 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වන මා වෙත පැවරී ඇති බලතල අනුව සම්පාදනය කරන ලද

“ **2012 අංක 03 දරන මහජන සෞඛ්‍ය පීඩා වැලැක්වීමේ රීති** ”නම් වූ රීතීන්

අංක 1771/23 හා 2012 අගෝස්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා දාතමින් යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය *(අතිවිශේෂ - **IV** (අ) වැනි කොටස - පළාත් සභා)* මඟින් ප්‍රකාශයට පත්කර ඇති අතර එම රීතීන් යථොක්ත ප්‍රඥප්තියේම 21(3) උපවගන්තියට අනුකූලව අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි.

## XIII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව

2012.10.10
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.